...identiality natur...
request.



## 1981.05.14 වෙනිදින පවත්වන ලද 1982 කෘෂිකර්ම සංගණනය පිළිබඳ සාකච්ඡාවටය.

**සහභාගි වූ අය :**

| | |
|---|---|
| 1. ඒ.ඒ.ඩී.සී.යසසිරි මයා. | : සහකාර අධ්‍යක්ෂ |
| 2. ඒ.පී.ඩබ්.නානායක්කාර මයා. | : සහකාර අධ්‍යක්ෂ |
| 3. කේ.ජයසිංහ මයා. | : සංඛ්‍යාලේඛනඥ |
| 4. එච්.එන්.සිරිවර්ධන මයා. | : සංඛ්‍යාලේඛනඥ |

1982 දී කෘෂිකර්ම සංගණනයට අදාල උපලේඛනය සාකච්ඡාවට භාජනය කරන ලදි.

1. ගියවර සාකච්ඡාවේදී ගොවි උපකරණ සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පූර්ව ලැයිස්තු ගත කිරීමේ පෝරමයට ඇතුලත් කළයුතු බව තීරණය කරනු ලැබුවත්, අවශ්‍ය වන්නේ ගොවි කාරකයන් මෙම උපකරණ භාවිතා කරයිද ? යන්න නිසා තොගය පිළිබඳ විස්තර බාගැනීම අවශ්‍ය නොවන බව තීරණය කරන ලදි.

2. 1981 ජන හා නිවාස සංගණනයට පෙර සකස් කරන ලද එච්.1 පෝරමයේ සඳහන් ගොවිකාරකයෙක් සිටීද ? නැද්ද ? යන තීරුව කොළඹ නගර සභාව වැනි ප්‍රදේශයකවත් නැවත සංශෝධනය කළහැකි නම් නගර සභාව වැනි සංකීර්ණ ඒකකවල එම නිවෙස්වල පමණක් යාම කළහැක. ඒ සඳහා කාලය ඇති බැවින් ඒ ගැන ක්‍රියාත්මක වීම වඩාත් ප්‍රතිඵලදායක බව තීරණය විය.

3. පසුගිය සාකච්ඡා වටයේදී කොළඹ නාගරික ප්‍රදේශය කිරීමට තිබෙන අපහසුතාවය නිසා ගොවි කාංඩය තුලින් ගොවි කාරකයා වෙත ඒමට තීරණය කලත්, එය කොතරම් දුරට ප්‍රායෝගිකද ? නැද්ද ? යන්න පොල් ප්‍රදේශයක සමීක්ෂණයක් කිරීමෙන් නිරාකරණය කර ගැනීමට සාකච්ඡා විය. පොල් ප්‍රදේශයක කරන සමීක්ෂණයක් මගින් ගොවි කාංඩය තුලින් ගොවිකාරකයා වෙත ඒම ගැන සෑහීමකට පත් විය නොහැකි නම් පූර්ව ලැයිස්තු ගත කිරීමේදී ගොවි කාරකයා කවරෙක්ද ? යන අතිරේක ප්‍රශ්නය යෙදීමෙන් එම කරුණ නිරාකරණය කර ගතහැක. එසේ නොමැති නම් එච්.1 අනුව සෑම නිවසකටම ගොස් ගොවිකාරකයෙක් සිටී නම් ඔහුගේ නම සහ ඔහුගේ කාරක තත්වය අනුව වර්ග කර දක්වා ඔවුන්ගේ අනුක්‍රමික අංකය සටහන් කිරීමෙන් පූර්ව ලැයිස්තු ගතකිරීම සම්පූර්ණ කලහැක.

   මේ අනුව කොළඹ නගර සභාවට අයත් එච්.1 පෝර්ම කීපයක නියද්දක් ගෙන දෙපාර්තමේන්තු කාර්ය මංඩලය ලවා එහි ගොවි කාරකයෙක් සිටීද ? යන තීරුව සමීක්ෂණය කිරීමට හා කොළඹ නගර සභාවට අයත් සියලුම එච්.1 පෝර්මවල අදාල තීරුව කාර්යාලය තුලදී පරීක්ෂා කර බැලීමට තීරණය විය.

4. හඳුනා ගැනීමේ තොරතුරු වලදී ගොවි කාරකයාගේ හා ගොවි කාංඩයේ අනුක්‍රමික අංක උපලේඛනය පිරවීමේදීම යෙදිය හැකි බව සාකච්ඡා විය. නියද්ද තේරීමේ ආරම්භක අංක දෙක සමීක්ෂණය ආරම්භයේදී ගණන් ගන්නාට දෙන බැවින් පූර්ව ලැයිස්තු ගත කිරීම කරන අවස්ථාදීම නියදි උපලේඛනය පිරවිය හැකි බව

request.



ද තීරණය විය. ගණන් ගන්නා නියම ආකාරයෙන් නියද්ද තෝරා ගනිද ? යන්න ප්‍රශ්නයකි. එනිසා සංඛ්‍යාලේඛන විමර්ශකවරුන් ලවා එය පරීක්ෂා කිරීමට තීරණය විය.

5. අදාල ෆෝර්මයේ කේත යෙදීම සඳහා ඇති කොටු එක පැත්තකට හා පේළියට දැමීමට හැකිනම් එය ගණන් ගන්නාට මගහැරීම් වලක්වා ගැනීමට හේතුවන අතර, පිදුගත කරන නිලධාරියාටද තම කාර්ය පහසු කරවයි. එබැවින් ඒ ගැන තීරණයක් ගැනීම දත්ත සංස්කරණ අංශයට තැබිය හැක. කෙසේ වෙතත්, කේත කොටු එක පැත්තකට ගෙන නව ෆෝර්මයක් සකස් කර බැලිය හැකියි.

6. අදාල ෆෝර්මයේ ගොවි කාරකයාගේ අධ්‍යාපන තත්වය පිළිබඳ තොරතුරු ඇසීමට ඇති කොටස අසම්පූර්ණයි. මෙහිදී 2 හා 3 යන කේත කොටු මෙයට වඩා පැහැදිලි වියයුතුයි. 9 ශ්‍රේණිය ද ඇතුළත්ව නැත. එනිසා 3 කොටුව 6 ශ්‍රේණියේ සිට 9 ශ්‍රේණිය දක්වා යනුවෙන් නිවැරදි වියයුතු අතර වරහන් තුල 6 හා 9 ශ්‍රේණි ඇතුලත්ව යනුවෙන් සඳහන් කළයුතුයි. 4 කොටුව (අ.පො.ස.(සා.පෙ) සමත්' ලෙස වෙනස් වියයුතුයි. 5 කොටුව අ.පො.ස.උසස් පෙල විෂයයන් 3 ක් හෝ වැඩි ගණනකින් සමත් යනුවෙන් වෙනස් විය යුතුයි.

අධ්‍යාපන සුදුසුකම් 'ඒ' ශිල්පීය සුදුසුකම් (ඇකඩමි) බී–කාර්මික හා වෘත්තිය සුදුසුකම් යනුවෙන් කොටස් 2 ට බෙදීම යෝග්‍ය බව තීරණය විය. මෙයින් 'ඒ' කොටසට වැටෙනුයේ කේත අංක කොටු 1–6 දක්වායි. බී කොටසේදී කාර්මික සුදුසුකම් හා වෘත්තිය සුදුසුකම් තිබේද ? නැද්ද' යන්න පමණක් ඇසීම ප්‍රමාණවත්ය. ඒ අනුව උසස් අධ්‍යාපනයක් ලබා වෘත්තිය සුදුසුකම් ලැබුවත් හා අධ්‍යාපනයක් නොලබා වෘත්තිය සුදුසුකම් ලැබූ අය පිළිබඳ විස්තර ඇතුළත් කොට වෙනම වගුවක් සැකසීමටද තීරණය විය.

7. මියවර සාකච්ඡාවේදී හවුල් කරුවන්ට සාපේක්ෂකව ඉඩමේ ප්‍රමාණය බෙදීමට කළ තීරණය පාක් මහතා ගෙන් විමසා බැලීමටද තීරණය විය.

මෙහිදී ගොවි කාරකයාගේ විවාහක තත්වය ඇතුළත් කිරීම අවශ්‍යද යන්න සාකච්ඡා කරන ලදුව එය අනවශ්‍ය බව තීරණය විය.

8. සේවා නියුක්තිය පිළිබඳව සාකච්ඡා කිරීමේදී සේවා නියුක්තිය අසනු ලබන්නේ මොන කාලය සඳහාද යන ප්‍රශ්නය මතුවිය. එය පසුගිය මාස 12 ට ඇසීම සුදුසු බව තීරණය විය. සේවා නියුක්තිය ගැන තවදුරටත් ප්‍රශ්න ඇතුළත් කළ යුතු ද ? යන්න ද සාකච්ඡා විය. දැනට ගොවි කාරකයා තමාගේ ගොවි කාංඩයෙන් බාහිරව වෙනත් ගොවි කාංඩ වල කරන වැඩ පිළිබඳව මෙහි සඳහන් නොවේ. ඒ නිසා ඒ සඳහා වගුවක්ද පිළියෙල කොට නැත. කාලය යෙදවීමේදී තමාගේ ගොවි කාංඩයේ හා බාහිර ගොවි කාංඩවල යෙදූ කාලය වැදගත් වනනිසා එය පූර්ව ගණන් ගැනීමේදී නොගෙන අවශ්‍ය නම් නියද්දට ඇතුළත් කළහැක.

සම්පූර්ණයෙන් ගොවි වැඩ කටයුතු වල යෙදූ කාලය උපදෙස් වල පැහැදිලි කළ යුතුයි.

identiality nature
request.

41

50



මෙහි කොටස් 3 න් 1 කොටුව එලෙසම තිබියදී 2 කොටුව අඩකට වඩා වැඩි හා 3 කොටුව අඩකට වඩා අඩු ලෙස වෙනස් කළයුතු බව සාකච්ඡා විය.

9. ගොවි කාරකයාගේ ඉඩමේ අයිතිය ගැන සාකච්ඡාවේදී 'ගෙවත්ත' යන්න නිර්වචනය කරගතයුතු බව තීරණය විය. කෙසේ වෙතත් ගෙවත්තේ විශාලත්වය අක්කරයකට සීමාවිය යුතු බවත්, අක්: 1 ට වැඩි නම් ගෙයක් සහිත වුවත් එය වෙනත් ඉඩම් යටතේ සඳහන් වියයුතු බවත් සාකච්ඡා විය.

මෙහිදී ගෙවත්ත හා අනිකුත් නිර්වචනයන් පිළිබඳ අනෙක් අයගෙන් අදහස් විමසීමට තීරණය විය. මෙහිදී 3 කොටුව හා 4 කොටුව මාරු කළයුතු බවද තීරණය විය.

2 කොටස - ගොවි කාංඩය

10. මෙහි 2 කොටුව දැනට මෙසේ තබා තව අදහස් ආවොත් විමසා බැලීමට තීරණය විය.

11. ගොවි කාංඩයේ නීත්‍යානුකූල තත්වය මෙදා ඇති විස්තර දැනට භාවිතයේ තිබේ ද ? ඉඩම් සංවර්ධන මංඩලය, සමුපකාර දෙපාර්තමේන්තුව ආදි තැන් වලට ගොස් මෙම වර්ගීකරණය අදට අදාලද යන්න විමසා බැලීමට තීරණය විය.

3 කොටස - බිම් භාවිතය හා ප්‍රධාන භෝග වර්ග

12. 1962 හා 1973 යන කෘෂි සංගණනවලදී ප්‍රධාන භෝග යටතේ කෙකෝවා හා කුරුඳු සඳහන් කර ඇත. එනිසා 1982 කෘෂි සංගණනයේදී ඒවා ඉවත් කළ යුතු ඇත. එහෙත් කොකෝවා ඇතුළත් කිරීමේදී ප්‍රශ්නය වන්නේ කොකෝවා ගස් යට වගාවක් වන බැවින් වගාකර ඇති මුලු බිම් ප්‍රමාණය ගණන් ගැනීමේදී දෙවරක් ගණන් ගැනීමට ඉඩ තිබීමයි. එනිසා කොකෝවා බිම් ප්‍රමාණය ගැන ඇසීමේදී තනිකර හා ගස්යට වගාව යනුවෙන් තව කොටසක් ඇතුළත් කළයුතු බවත්, වගාකළ මුලු බිම් ප්‍රමාණයට කොකෝවා යටතේ ඇති බිම් ප්‍රමාණය ඇතුළත් නොකළ යුතු බවත්, සාකච්ඡා විය. මේ ගැනත් අදාල දෙපාර්තමේන්තුවෙන් විමසා බැලීමට තීරණය විය.

4 කොටස - ගව,එලු,බැටලු,ඌරන්,කුකුලු,තාරාදි සතුන්.

13. මෙහි කිරට යන කොටස, කිරට ඇති කරන, කිරි තිබෙන කිරි වැරූ ලෙසින් කොටස් 3 කට වෙන් කළ යුතුයි. මෙය අදාල අමාත්‍යාංශය සමග සාකච්ඡා කර කළයුතු වෙනසක් නම් වෙනස් කිරීමට තීරණය විය.